චක්‍රලේඛ අංක :- 05 /2018

මගේ අංක :- සෙක් 06/01/2018,

බන්ධනාගාර මූලස්ථානය,

කොළඹ 09.

2018.02.02

සියළුම බන්ධනාගාර අධිකාරීන් සහ,

සහකාර අධිකාරීන් වෙත.

**2018.02.04 වන දිනට යෙදෙන 70 වන ජාතික නිදහස් දිනය වෙනුවෙන් අතිගරු ජනාධිපති තුමා විසින් පිරිනමනු ලබන විශේෂ රාජ්‍ය සමාව.**

2018.02.04 වන දිනට යෙදෙන 70 වන ජාතික නිදහස් දිනය වෙනුවෙන් අතිගරු ජනාධිපති තුමා හට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 34 වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව පහත දැක්වෙන පරිදි බන්ධනාගාර සිර දඩුවම් නියමකර ඇති සිරකරුවන් සඳහා පොදු සමාවක් ප්‍රධානයකර ඇත.

01. බන්ධනාගාර ගතව 2018.02.04 වන දිනට සිර දඩුවම් විඳින සියළුම සිරකරුවන් හට ගෙවන ලද (ගතකරන ලද) වසරකට හා ඉන් කොටසකට සතිය (දින 07 ක) බැගින් සමාවක් ලබාදීම.

02. දඩ මුදල් නොගෙවීම සම්බන්ධයෙන් බන්ධනාගාර ගතව 2018.02.04 වන දිනට සිර දඩුවම් විඳින සිරකරුවන්ගේ ගෙවමින් පවතින දඩුවමේ ඉදිරි ශේෂය අහෝසි කිරීම.

03. වසර 10 කට වැඩි කාලයක් සිර දඩුවම් විඳිමින් සිටින 2018.02.04 වෙනි දිනට වයස අවුරුදු 70 ඉක්මවූ සිරකරුවන්ගේ ගෙවමින් පවතින දඩුවමේ ඉදිරියට ඇති ශේෂය අහෝසි කිරීම.

ඉහත දැක්වෙන අංක (i) සිට (xxx) දක්වා වූ වැරදි (වගන්ති) සඳහා සිර දඩුවම් විඳින සිරකරුවන් හට ඉහත සඳහන් අංක :- 01, 02 සහ 03 යටතේ දක්වා ඇති විශේෂ රාජ්‍ය සමාව හිමි නොවේ.

| | වරද | දණ්ඩනීති සංග්‍රහයේ වගන්තිය |
|---|---|---|
| i. | නීති විරෝධී රැස්වීම | 140 සිට 142 සහ 146 |
| ii. | මංකොල්ල | 380, 382 සහ 383 |
| iii. | ගෙවල් බිඳීම සහ රාත්‍රී කාලයේ ගෙවල් බිඳීම | 431, 432,440,441 ගෙවල් බිඳම<br>443 සහ 446 රාත්‍රී ගෙවල් බිඳීම |
| iv. | රාජ්‍ය ද්‍රෝහී ක්‍රියා | 114 – 123 |
| v. | පැහැරගෙන යාම | 354 – 360 |
| vi. | අසභ්‍ය ප්‍රකාශන ළමුන්ට අදාල ප්‍රදර්ශණය | 286A |
| vii. | ළමුන්ට හිංසා කිරීම | 308A |
| viii. | ණය බැඳුම්කර හෝ දාස භාවයට පත්කිරීම.<br>බලහත්කාරයෙන් වැඩ ගැනීම.<br>වහල් කමට භාජනය කිරීම සහ යුද්ධයේ යෙදවීම සඳහා ළමයින් බඳවා ගැනීම. | 358 A |

| | | |
|---|---|---|
| ix. | කුට්ටනය | 360 A |
| x. | ළමයින්ගෙන් අයුතුලෙස ලිංගික ප්‍රයෝජන ගැනීම. | 360 B |
| xi. | තැනැත්තන් වෙළඳාම් කිරීම. | 360 C |
| xii. | ළමයකු පොළඹවා ගැනීමට ඇවිටිලි කිරීම. | 360 E |
| xiii. | දූෂණය කිරීම. | 364 |
| xiv. | ව්‍යාභිචාරය. | 364 A |
| xv. | අස්වාභාවික ලිංගික වැරදි. | 365 |
| xvi. | පුද්ගලයින් අතර දැඩි අශිෂ්ඨ ක්‍රියා | 365 A |
| xvii. | බරපතල ලිංගික අයථා ක්‍රියා | 365 B |

xviii. අල්ලස් පනත යටතේ වැරදිකරුවන් වූවන්.

xix. 1966 අංක 18 දරණ පීඩාකාරී ආයුධ පනතේ වැරදි.

xx. ගිණිඅවි ආඥා පනත යටතේ වැරදිකරුවන් වූවන්.

xxi. 1979 අංක 48 දරණ ත්‍රස්තවාදය මර්ධන (තාවකාලික) විධි විධාන පනත යටතේ වැරදි.

xxii. 1982 අංක 24 දරණ ගුවන්යානා එරෙහි පනත යටතේ වැරදි.

xxiii. වස, අබිං හා අන්තරායකර ඖෂධ පනත යටතේ වැරදි.

xxiv. හදිසි නීතිය යටතේ ගැනෙන වැරදි.

xxv. ආදායම් බදු නඩුවල මුදල්ගෙවීම පැහැර හැරීම සම්බන්ධයෙන් සිර දඬුවම් විඳින්නන්.

xxvi. රේගු ආඥා පනත යටතේ වැරදි කරුවන් වූවන්.

xxvii. 2006 අංක 05 දරණ නීති විරෝධී මුදල් රඳවාගැනීම වැලැක්වීමේ පනත යටතේ වැරදිකරුවන් කරනුලැබූ අය.

xxviii. 2006 අංක 06 දරණ මූල්‍ය ගණුදෙණු වාර්ථාකරණය යටතේ වරදකරුවන් කරනු ලැබූ අය.

xxix. 2005 අංක 25 දරණ සත්‍ය වසන්කර ත්‍රස්තවාදයට මූල්‍යාධාර සැපයීමේ පනත යටතේ වරදකරුවන් කරනුලැබූ අය.

xxx. ඉහත අංක i සිට xxix යටතේ දැක්වෙන වැරදි සම්බන්ධයෙන් යුධ හමුදා පනත, නාවුක හමුදා පනත හෝ ගුවන් හමුදා පනත යටතේ යුද්ධාධිකරණය විසින් වැරදි කරුවන් කරනුලැබූ අය.

ඉහත සඳහන් විශේෂ සමාව අදාල වනුයේ 2018.02.04 වන දින වනවිට බන්ධනාගාර ගතව සිර දඬුවම් විඳිමින් සිටින සිරකරුවන් හා සිරකාරියන් කෙරෙහි පමණි. මුදාහැරීම ක්‍රියාත්මක ක්‍රියාත්මක කලයුතු දිනය 2018.02.04 දින වේ.

එක් සිරකරුවකු හට ඉහත විශේෂ රාජ්‍ය සමාවෙන් හිමිවිය යුත්තේ එක් වරප්‍රසාදයක් පමණි.

මෙම විශේෂ සමාව යටතේ ඔබ ආයතනයෙන් මුදාහරිනු ලබන සිර කරුවන් හා සිරකාරියන් සංඛ්‍යාව 2018.02.04 වන දින පෙ:ව: 11.00 ට පෙර දුරකථන පණිවුඩයක් හෝ ෆැක්ස් පණිවුඩයක් මගින් දැනුම් දී නිදහස් කිරීමෙන් පසු ලිපියක් මගින් විස්තර සහිතව සනාථ කිරීමට කටයුතු කරන්න.

එච්.එම්.එන්.සී.ධනසිංහ,

බන්ධනාගාර කොමසාරිස් ජනරාල්.

එච්.එම්.එන්.සී. ධනසිංහ
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ - 09.